(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 444.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 මාර්තු මස 20 වැනි සිකුරාදා අ. භා. 1.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4792/'14

1\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1994, 2005 සහ 2013 වන විට මෙරට තිබූ ඇඟලුම් කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2013 දක්වා කාල සීමාව තුළ දී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබූ ඇඟලුම් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) ආයෝජන ප්‍රවර්ධන කලාපවල පිහිටා තිබෙන ඇඟලුම් කර්මාන්තශාලාවල සේවකයන්ගේ සුබසාධනය සඳහා රජය විසින් යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4822/'14

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ පිහිටා ඇති කඩ කාමර හා රථ ගාල ගැණුම්කරුවන්ට ලබාදීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(ii) ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකළේ නම්, ඒවා ලබාදුන් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පරිදි ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ අයගේ නම්, ලිපිනයන් සහ එක් එක් ටෙන්ඩර් අයදුම්පතෙහි සඳහන් මුදල වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ පිහිටි කඩ කාමර සහ රථ ගාලෙහි වර්තමාන හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම එක් එක් පුද්ගලයා විසින් එම කඩ කාමර සහ රථ ගාල ලබාගෙන ඇති මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5436/'14

3\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තය සතු මුතුරාජවෙල ටැංකි සංකීර්ණය සඳහා ආනයනය කළ ඩීසල්වල ගෙන්දගම් ප්‍රතිශතය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඉන්ධන පිරවුම්හල්වල විකිණීමට ඇති ලංකා ඔටෝ ඩීසල් සහ සුපර් ඩීසල්වල ඇති ගෙන්දගම් ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති ඉන්ධන පිරවුම්හල්වලට ලංකා ඔටෝ ඩීසල් හා සුපර් ඩීසල් ලබා දෙන්නේ කුමන ඛනිජ තෙල් ගබඩා පර්යන්තයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5692/'14

4\.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගොවි විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු සුදුසුකම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උඩුකිඳ, මැදවෙල, කරගහඋල්පත යන ලිපිනයේ පදිංචි යසවතී කුමාරිහාමි ජයසුන්දර මහත්මිය ගොවි විශ්‍රාම වැටුප් ලබාගැනීම පිණිස කෘෂිකාර්මික හා ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වී තිබේද;

(ii) ඇය ගොවි විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා තිබේද;

(iii) ඇය ඒ සඳහා සුදුසුකම් ලබා ඇත්නම්, ඇයට මෙතෙක් ගොවි විශ්‍රාම වැටුප් නොගෙවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5863/'15

5\.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට සමෘද්ධි සහනාධාර ලබා දෙන අඩු ආදායම්ලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් පවුලක් වෙනුවෙන් ලබා දෙන සහනාධාරවල වටිනාකම කොපමණද;

(iii) 2015 වර්ෂයේ දී එම මුදල ඉහළ දැමීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ අනුව වැඩි කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5876/'15

6\.
ගරු ලලිත් දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අධිපතිවරයා කවුරුන්ද;

(ii) එම තැනැත්තාට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය තිබේද;

(iii) එසේ නම්, ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබාගත් දිනය කවරේද;

(iv) ඔහු ශ්‍රී ලංකා පුරවැසියෙක් නොවේ නම්, ඔහුට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති තනතුර දැරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5877/'15

7\.
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දිගම වෙරළ තීරය අයත් වන පුත්තලම් දිස්ත්‍රික්කය තුළ එකදු ධීවර වරායක් හෝ ධීවර නැංගුරම්පළක් ඉදිකර නොමැති බවත්;

(ii) පසුගිය රජය ඉදිරිපත් කළ 2013/2014 අයවැය යෝජනා අතර වෙන්නප්පුව ප්‍රදේශයේ ධීවර වරායක් ඉදිකිරීම සඳහා යෝජනාවක් තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් යෝජනාවට අනුව, වෙන්නප්පුව ප්‍රදේශයේ ධීවර වරායක් ඉදිකිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම වෙන් කළ මුදලින් ධීවර වරාය ඉදිකිරීම ආරම්භ කරන දිනය කවරේද;

(iii) එකී ධීවර වරාය ඉදිනොකරන්නේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5891/'15

8\.
ගරු ලසන්ත අලගියවන්න මහතා,— නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) දිවයින තුළ ඇති පිරිසිදු පානීය ජල පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) දිවයිනේ ඇති මුළු නිවාස සංඛ්‍යාව අතරින් පානීය ජල පහසුකම් ලබා දී ඇති නිවාස සංඛ්‍යාවේ ප්‍රතිශතය කොපමණද;

(iii) පානීය ජල පහසුකම් ලබා දීමට ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) එම නිවැසියන්ට පානීය ජල පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් ගන්නා තීරණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5895/’15

9.

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසය තුළ පිහිටා ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල නම් හා ඒවායේ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්පෙවත්ත, මින්විසිතුරුගම ගම්මානයේ ජනතාව පදිංචි ඉඩම්වල අයිතිය නියමානුකූල කර දෙන ලෙස එකී ජනතාව විසින් කරනු ලබන ඉල්ලීමට එකඟ වන්නේද;

(iii) එසේ නම්, අදාළ ඉඩම් සඳහා ඔප්පු ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසයේ, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹෝර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අක්කර 10ක ඉඩම, ගම් පුළුල් කිරීමේ පදනම යටතේ ප්‍රදේශයේ ජනතාවට බෙදා දීමට යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එකී ඉඩම ඉඩම් කච්චේරියක් මගින් එම ප්‍රදේශයේ ජනතාවට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4793/’14

10.

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ ලියාපදිංචි සමස්ත උපාධිධාරීන් අතරින් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව හා අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂයක් තුළ දී රජයේ විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ දින සිට විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම දක්වා ගත වන කාල සීමාව කොපමණද;

(iv) මේ වන විට එම කාල සීමාව වර්ෂයකට ද වැඩි කාල සීමාවක් බවට පත්වී ඇති බව දන්නේද;

(v) එම තත්ත්වයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත්කිරීමෙන් පසු ඉතා ඉක්මනින් විශ්වවිද්‍යාල සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4823/'14

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත් වායු සමනය කළ සුඛෝපභෝගී වාහන නාවික හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත් සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5693/'14

12.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 04 ක කාලය තුළ ශ්‍රී ලංකාව විසින් විදේශ රටවල් හෝ ආයතන වෙත ලබා දුන් මූල්‍යමය හා අනෙකුත් ආධාර කවරේද;

(ii) එම මූල්‍යමය හා අනෙකුත් ආධාර දෙනු ලැබුවේ කවර අවශ්‍යතාවන් වෙනුවෙන්ද;

(iii) එම මූල්‍යාධාර හා අනෙකුත් ආධාර සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5864/'15

13.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට රට තුළ ස්ථාපිත කර ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම පොලිස් ස්ථානවල අඩුපාඩු රැසක් පවතින බවත්;

(ii) අලව්ව පොලිස් ස්ථානයද නවීකරණයට ලක් කළ යුතුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) අඩුපාඩු සහිත පොලිස් ස්ථාන නවීකරණය කිරීමට හෝ අලුතින් ඉදිකිරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

14\.

ගරු ලසන්ත අලගියවන්න මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.01.01 දින වන විට දිවයින තුළ සිටි සමෘද්ධි සහනාධාරලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සංඛ්‍යාව එක් එක් මාසික සහනාධාර මුදල් කාණ්ඩය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් කාණ්ඩය යටතේ සමෘද්ධි සහනාධාරය ලබාදීමට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ අයවැය යෝජනා මගින් ලබා දුන් සහන ද ඇතුළත් එක් එක් මාසික සහනාධාර කාණ්ඩය අනුව 2015 ජනවාරි 31 වැනි දිනට සිටි සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව; සහ

(ii) එම එක් එක් කාණ්ඩය යටතේ එකී සහනාධාර ලබා දීමට වැය කළ මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දින සියයේ වැඩ සටහන වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සංශෝධිත අයවැය මගින් ලබා දුන් සහන ද ඇතුළත් කළ පසු එක් එක් මාසික සහනාධාර කාණ්ඩය යටතේ සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව; සහ

(ii) එම එක් එක් කාණ්ඩය යටතේ සමෘද්ධි සහනාධාර ලබාදීමට මාසිකව වැයවන මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2011.04.07 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.30ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග අංක 7(1) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2015 මාර්තු මස 24 වැනි අඟහරුවාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2015 මාර්තු මස 24 වැනි අඟහරුවාදා රැස්වීම පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2015 මාර්තු මස 24 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*9.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*10.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

11.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

17.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---